B

# නිවේදනය

සියලුම ගරු මන්ත්‍රීවරුනි, ලෝකයේ දියුණු රටවල්වල දැනට පවතින තත්ත්වයන් පිළිබඳවද, විවිධාකාර දේශීය විදේශීය විද්වතුන්, විශේෂඥයන් විමසීමෙන් ඉදිරිපත් කළ අදහස්ද, මැනවින් අධ්‍යයනය කර මන්ත්‍රීවරුන්ගෙන් අපේක්ෂා කරනු ලබන අවශ්‍ය විශිෂ්ඨතා මට්ටම සම්බන්ධයෙන් මහජන විශ්වාසය ඇති කිරීම පිණිසත්, පාර්ලිමේන්තුවේ කැපවීම සහතික කිරීම පිණිසත්, අවශ්‍ය වන්නාවූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය කෙටුම්පතක් වශයෙන් සකස් කර මීට මාස තුනකට පමණ පෙර සෑම මන්ත්‍රීවරයෙකුටම ලබා දීමෙන් අනතුරුව ලැබුණු විවිධ අදහස්ද, යෝජනාද යනාදී සියල්ලම සලකා බලා අවසාන වශයෙන් නීති කෙටුම්පත් සම්පාදකවරයාගේද සහාය ඇතිව යථා පරිදි සකස් කරන ලද එහි අවසාන පිටපත ඔබතුමන්ලා සෑම දෙනාගේ අනුමතිය සඳහා පිළිගන්වමින් සභාගත කරන බව මෙයින් මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

තවද, පසුගිය පාර්ලිමේන්තු කිහිපයකදීම දශක දෙකක පමණ කාලයක් පුරාවට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව විසින් දීර්ඝ වශයෙන් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව අටවැනි පාර්ලිමේන්තුවේදීද ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවට අමතරව වර්තමාන අමාත්‍යවරයන් වන ගරු රවුෆ් හකීම්, ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ, වර්තමාන පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා ලෙස කටයුතු කරන ගරු රාජවරෝදයම් සම්පන්දන්, හත්වැනි පාර්ලිමේන්තුවේ හිටපු කථානායක ගරු චමල් රාජපක්ෂ යන පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමන්ලාගෙන් සමන්විත විශේෂ කමිටුව විසින් ඉදිරිපත් කර ලද නිර්දේශද, ලෝකයේ දියුණු රටවල්වල විවිධ පාර්ලිමේන්තුවල පවතින ස්ථාවර නියෝගද, සලකා බලා නීති කෙටුම්පත් සම්පාදකවරයාගේද සහාය ඇතිව යථා පරිදි සකස් කරන ලද පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අවසාන කෙටුම්පත් පිටපත ඔබතුමන්ලා සෑම දෙනාගේ දැනගැනීම හා අධ්‍යයනය පිණිසත්, ඉදිරියේදී විවාද කර පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගැනීමට අපේක්ෂා කරමින් මෙලෙස පිළිගන්වමින් සභාගත කරන බවද මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.